# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්..ත

**සමාජීය විද්‍යා පීඨය**

**ජාත්‍යන්තර අධ්‍යයනය**

**ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය**

**INTS 28224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ජාතික අභිලාෂය සහ ජාතික බලය එක්ව රටක විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තීරණය කරන ආකාරය උදාහරණ සමඟින් සාකච්ඡා කරන්න.

02. පහත දක්වා ඇති ප්‍රශ්න දෙකෙන් එකක් තෝරාගෙන පිළිතුරු ලියන්න.

    (i) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක විසින් අනුගමනය කල නොබැඳි පිළිවෙත ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීමට දායක වූයේ කෙසේද?

    (ii) සිරිමාවෝ බණ්ඩාරනායක නායකත්වය නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය (NAM) තුළ ශ්‍රී ලංකාවේ භූමිකාව කොතෙක් දුරට ශක්තිමත් කළේද?

03. 1980 දශකයේදී ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා සන්දර්භය තුළ ජේ. ආර්. ජයවර්ධනගේ විදේශ ප්‍රතිපත්තිය විවේචනාත්මකව විමසීමට ලක් කරන්න.

04. 1989-1993 අතර ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?

05. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වාර්ගික ගැටුම සහ කලාපීය රාජ්‍ය තාන්ත්‍රිකභාවය කළමනාකරණය කිරීමේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ විදේශ ප්‍රතිපත්තිය අගයන්න.

06. ආසියාවේ භූ දේශපාලනික පරිසරය සැලකිල්ලට ගනිමින් චීනය, ඉන්දියාව සහ බටහිර රටවල් සම්බන්ධ මහින්ද රාජපක්ෂගේ විදේශ ප්‍රතිපත්තිය විශ්ලේෂණය කරන්න.

07. මානව හිමිකම් ගැටළු සහ පශ්චාත් යුධ සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේදී, යහපාලන රජය (2015-2019) එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට ප්‍රවේශ වූ ආකාරය පරීක්ෂා කරන්න.

08. වර්තමාන අපේක්ෂා සහ අනාගත අවශ්‍යතා දෙස බලන විට, ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු විදේශ ප්‍රතිපත්ති ප්‍රමුඛතා මොනවාද?

**************************************